මගේ අංකය : සං/වආ/ප්‍රති
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
තැ.පෙ. 1474
කොළඹ
1996.09.30.

**වගා ආධාර චක්‍රලේඛ අංක 46 ඒ.**

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් සහ
ව්‍යාප්ති නිලධාරීන් වෙත.

**කුඩා තේ වතු සංවර්ධන සමිති තුලින් ක්‍රියාත්මක වන විශේෂ පාලු සැපයීමේ වැඩ පිළිවෙල සඳහා 1996.01.19 හා 1996.06.11 දිනෙන් නිකුත් කරන ලද වගා ආධාර චක්‍ර ලේඛ අංක 46 සඳහා සංශෝධන ඇතුලත් කිරීම.**

උක්ත කරුණට අදාලව සභාපතිතුමා විසින් ඔබ වෙත එවන ලද 96.08.21 දිනැති ලිපිය කෙරේද අවධානය යොමු කරමි.

උක්ත චක්‍රලේඛ වලින් දී ඇති උපදෙස් වලට අමතරව පහත සංශෝධන ඇතුලත් කරනලද බව මෙයින් දැනුම් දෙමි.

1. සමිති විසින් අදාල ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේදී හිමිකම් ප්‍රකාශය සම්පූර්ණ කර එවීම අවශ්‍ය නොවන අතර, සාමාජික ඉඩම් පිළිබඳව අදාල ලේඛණය මගින් ඉදිරිපත් කරනු ලබන සමිතියේ නිර්දේශය පිළිගත හැකිය.

2. එක් එක් සාමාජිකයන් විසින් තේ ඉඩම් කප්පාදු කර ඇති බවට සමිතිය විසින් පූර්ණ වගකීමක් සහිතව සහතික කරන්නේ නම් පමණක් එම ඉඩම් හිමියනට ආධාර ක්‍රමය යටතේ පැල/ආධාර මුදල සැපයිය යුතුය. සමිතිය එම වගකීම පැහැර හැර ඇති බව පෙනී යන්නේ නම් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් සමිති රැස්වීමක් වහාම කැඳවා චක්‍රලේඛය හා පාළු සැපයීම පිළිබඳ අවබෝධයක් ලබාදී අදාල නිර්දේශය සමිතියෙන් ලබා ගන්න.

3. නිසි පරිදි අවශ්‍යතා සම්පූර්ණ කර නැති ඉල්ලුම්කරුවන් සඳහා 1997 වර්ෂයේදී වගා කිරීමට වෙනම ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා අවශ්‍ය තේ පැල ප්‍රමාණය සකස් කර ගැනීම පිණිස චක්‍රලේඛ සීමාවන් යටතේ ද්‍රව්‍යමය අත්තිකාරම් සැපයිය යුතුය. ඒ අනුව මේ සඳහා ද තවාන් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු නොපමාව පිළියෙල කර දිය යුතුය.

4. මෙම වර්ෂයේ පාලු සැපයීමට අවශ්‍යතා සම්පූර්ණ කර පැල ප්‍රමාණය සපයා ගැනීමේ මාර්ග හඳුනාගෙන සිටින ඉඩම්හිමියන්ට, අවශ්‍යතාවයකින් තොරව මෙම පාලු ආධාර ක්‍රමය යටතේ පාලු පැල සිටුවීමට අවශ්‍ය සියලු පහසුකම් සැපයීම අරමුණයි.

5. එක් එක් ප්‍රදේශයෙන් ප්‍රදේශයට රිකිලි තේ පැලයක මිල වෙනස් වුවත් පැල මිලදී ගැනීමේ, කෘෂීයය ද්‍රව්‍ය ලබා දීමේ කාර්යය සඳහා අධිකාරියට වැය කල හැක්කේ දැනටමත් දැනුම් දී ඇති පරිදි පැලයකට රු. 4/- උපරිමයක් පමණි.

..2 පිටුවට

6. විවිධ ආධාර ක්‍රම යටතේ (උදා: ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම) ද මෙම ක්‍රමය හෝ මීට සමාන ක්‍රම මගින් පැළ සැපයීමේ ආධාර එක් එක් ප්‍රදේශයන්හි ක්‍රියාත්මක වේ. එක් ක්‍රමයක් මගින් ආධාර කරන ලද ඉඩම් සඳහා වෙනත් මූලයාධාරයක්/ක්‍රමයක් මගින් නැවත ද එම ඉඩම් සඳහා ආධාර ලබා දීම නො කළ යුතුය.

7. පැළ සපයනු ලබන ඉඩම් හිමිකරුවන්ට ඔවුන්ගේ සමිති රැස්වීමකදී කොම්පෝස්ට් සෑකසීම, භාවිතය, පැළ සැපයීම හා සැපයූ පැල රැකබලා ගැනීම/නඩත්තුව පිළිබඳව තේ පරීක්ෂක/ව්‍යාප්ති විසින් දැනුවත් කළ යුතුය.

ඉහත කරුණු අනුව අදාල වන තත්වයන් පිළිබඳව කඩිනමින් සමිතිවල ප්‍රධානීන් දැනුවත් කර ඉදිරි කටයුතු කරන්න.

මෙම ලිපිය ලද බවත් ඒ අනුව ක්‍රියා කරන බවත් දන්වන්න.

(රෝහණ ඉලංගරත්න)
සභාපති.

පිටපත්:- 1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාප්ති) : මෙහිදී තාක්ෂණික කරුණු පිළිබඳව අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් මූලික පුහුණුවක් ලබා දී ඔවුන් මගින් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්ට දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කරන්න.

2. අභ්‍යන්තර විගණක.
3. මුදල් කළමණාකරු.
4. ව්‍යාපෘති කළමණාකරු
5. සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන)

ම/9/20